# දෙව්රම් වෙහෙර

බුද්ධ ශ්‍රාවක ධර්මපීඨයේ කථිකාචාර්ය
පොතාංනේ ධම්මානන්ද ස්ථවිර

ලක්දිව ශාසන ඉතිහාසයේ විශාල පෙරලියකට තුඩු දුන් ලංකාවේ පමණක් නොව ලොව විශාලතම චෛත්‍යය වශයෙන් සඳහන් වන අනුරාධපුර ජෝතිය වනයෙහි පිහිටි ජේතවනාරාම චෛත්‍යය ප්‍රතිසංස්කරණ කටයුතු ත්‍රිකෝණ සංවර්ධනය යටතේ මේ දිනවල කරගෙන යනු ලැබේ.

බු ව. 817 – 844 අතර රජකළ මහසෙන් රජතුමාගෙන් ජේතවන චෛත්‍යය ආරම්භ වුවද මෙබඳු චෛත්‍යයක් ගොඩනැගීමට හේතුවූනු කරුණු ඊට කලකට පෙර ඇතිවුණු බව පෙනේ. මෙහිදී ඒ පසුබිම් සකස් වූ ආකාරය ගැන විමසීම වැදගත් වේ. දඹදිව පල්ලලාරාමයෙන් මෙහි පැමිණි ධම්මරුචි නම් තෙරනමක් අභයගිරියේ විසීය. එතැන් සිට ධම්මරුචි නමින් නිකායක්ද පිහිටුවා ගෙන ථෙරවාදයට පටහැනි මත පතුරුවන්නට පටන් ගත්හ. ව්‍යවහාරතිස්ස රජු දවස කපිල ඇමති ලවා පිරිසිදු කරවීය. නැවත ගෝඨාභය රජු දවස වෛතුල්‍ය මත ඉස්මතු වූ කාලයයි. මහාවිහාර භික්ෂූන්ගේ අනුමැතියෙන් පාපී භික්ෂූන් හැටනමක් තෝරාගෙන හන්වඩු ගසා රටින් පිටවහල් කරවීය. අභයගිරි වාසී පුස්සලියාතිස්ස නම් තෙර නමක් තවත් 300 ක් දෙනා සමඟ අභයගිරියෙන් වෙන්ව දක්ෂිනාරාමයට ගියහ. සාගල නම් තෙර නමකගේ මූලිකත්වයෙන් සාගලික නම් නිකායක්ද පිහිටුවා ගත්හ. හන්වඩු ගසා රටින් පිටුවහල් කරන ලද පිරිස කාවේරි පටුනේදී මුන ගැසුන සංඝමිත්‍ර නම් ථෙර මහාවිහාරය වනසන බවට හෝ තම මතයන්ට මහාවිහාර භික්ෂූන් නැඹුරු කරවා ගන්නා බවද පොරොන්දු දී ලක්දිවට අවුත් ථූපාරාමයේ විසීය. ගෝඨාභය රජුගේ සිත් දිනාගත් සංඝමිත්‍ර රජුගේ පුත් කුමරුවන් වන දෙවුතිස්සට සහ මහසෙන්ට ඉගැන්වීමට පටන් ගත්හ. මහසෙන් කුමරු තමාගේ ඉතා හිතවත් ශිෂ්‍යයා බවට පත්කර ගන්නට සංඝමිත්‍ර සමත් විය.

ගෝඨාභය රජුගේ අභාවයෙන් පසු රජ පැමිණි දෙවුතිස්ස රජුගේ දස අවුරුදු රාජ්‍ය කාලය තුල සොලී රට විසූ සංඝමිත්‍ර මහසෙන් කුමරු රජ පැමිණි විට නැවත ලක්දිවට අවුත් මහසෙන් රජු සිත් දිනා ගෙන මහාවිහාරයට දන් දුනහොත් දහසක් දඩයැයි නුවර බෙරලැවීය. මහා විහාර භික්ෂූන් රුහුණට හා මලය රටට ගියහ. සංඝමිත්‍ර සෝන නම් ඇමතියකුද සමඟ භික්ෂූන්ගෙන් හිස්වූ මහාවිහාරයට අයත් ස්ථාන විනාශ කළහ. රජුගේ අනුමැතිය ඇතිව කරනු ලබන මේ දරුණු විනාශයන් දුටු මේඝවර්ණාභය ඇමති මැදිහත්ව ඒ විනාශයන් නතර කර නැවත මහාවිහාරය ප්‍රතිසංස්කරණය කරවීය. රජමෙහෙසියකගේ අනුදැනුම පිට ථූපාරාම චෛත්‍යය ප්‍රතිසංස්කරණයේ යෙදී සිටි වඩුවකු විසින් සංඝමිත්‍ර මරාදැමූ අතර සෝණ ඇමතියාද මැරුම් කෑහ.

**දෙව්රම ගොඩනැගීම:–**

විහාර ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කළ මහසෙන් රජු නොදැනුවත්වම තවත් අවුලකට අත ගැසීය. මහාවිහාර භික්ෂූන්ගේ විරෝධය නො තකා මහාවිහාර සීමාව තුලම තමාගේ හිතවත් කොහොන් තිස්ස නම් භික්ෂූන් වහන්සේ උදෙසා ජෝතිය වනයෙහි ජේතවනාරාමය ගොඩනැගීම ආරම්භ කළහ. වංශ කථාවට අනුව දක්ෂිණාරාමයෙහි විසූ තිස්ස නම් කුහක පාපී භික්ෂුව කෙරෙහි ප්‍රසාදයට පත් රජු තමාගේ හිතවත් තිස්ස භික්ෂුව සඳහාම ජේතවනය ගොඩනගා ඇත මහාවිහාර භික්ෂූන් මෙයට විරුද්ධ වූ විට රජුගේ නියමය වූයේ එසේ නම් සීමාවන් උගුලුවන ලෙසය. මේ සඳහා විරෝධය පෑ මහාවිහාර භික්ෂූන් සීමා ඉගිලවීම කෝප්‍ය කරනු සඳහා මහාවිහාර සීමාව තුළ බිම්ගෙයක රහතන් වහන්සේලා හත් නමක් රඳවා විහාර හැර මලය රටට හා සිතුල්පව්වට වැඩියහ. රජතුමා දෙව්රම කරවා තිස්ස භික්ෂුවටම දුන්හ. ජේතවන භික්ෂූන් සීමා උගුලුවන්නට පටන්ගත් විට සිතුල්පව් වැසි අභිඥලාභී භික්ෂු නමක් මහත් භයංකර රාක්ෂ වේශයක් මවාගෙන ඔවුන් භය ගැන්වූහ. මෙයට පිළියම් වශයෙන් නැවතත් මහාවිහාර භික්ෂූන් කමා කරවා ගෙන ගෙන්වා ගත්හ.

කෙසේ වුවද ජේතවනය පිළිගත් තිස්ස භික්ෂුවට අන්තිම වස්තුවෙන් චෝදනා නැගිණි. රජුගේ ධාර්මික නම් ඇමති මගින් එය විභාගකර ඔප්පු වුන හෙයින් සිවුරු හැරවීය. ජේතවනයෙහි නැවත මතභේද ඇතිවූයේ අඹහෙරන සලමෙවන් රජු දවසය. බරණැස සිට පැමිණි පූර්ණ නම් වෙළෙන්දෙක් ධර්මධාතු නම් වෛතුල්‍යවාදී පොතක් රැගෙන ආහ. මුලදී දෙව්රම් වාසීන් විසින් මෙය පිළිගන්නට අකමැති වුවද අභයගිරිකයින් ඉතා සියුම් අන්දමින් ධර්මධාතු පිළිගැනීමට දෙව්රම් වාසීන් කැමති කරවා ගත්හ. රජුද එය මහ ඉහලින් පිළිගෙන ජේතවනයෙහි තබා පූජා පවත්වන්නට නියම කළහ. නිකාය සංග්‍රහයෙහි එය සඳහන්ව ඇත්තේ මෙසේය:–

"එකල අභයගිරි වාසීහු ද කාරණා කියා ගිවිස්සා පැහැයෙන් එක්වැනි හෙයින් දඹයැයි දක්වා බාල දරුවන් කුරුවේණියන් කවන අධමයන් සේ දෙනා වෙහෙර වැසි අඥාන මහණුන් ලවා සත්කාර කරවූහ." අග්‍රබෝධි රජ දවස ජෝතිපාල නම් මහතෙරුන් විසින් නැවත ඇති නොවන සේ වෛතුල්‍ය වාදය පරාජයට පත්කරනලද බව වංශකථාවේ සඳහන් වේ. ඉන්පසු ජේතවනය මහාවිහාරයට අවනත වූ බව නිකාය සංග්‍රහයේ සඳහන් වේ.

අනුරාධපුර යුගයේ චෛත්‍ය නිර්මානය කළ රජුන් අතරින් අන්තිමයා ලෙස සලකනු ලබන්නේ මහසෙන් රජුය. එසේම විශාලතම, චෛත්‍යයද ජේතවනාරාමයයි. ඉන්පසු වෙනත් චෛත්‍යයක් අනුරාධපුරයෙහි ගොඩනගා නැත. රජවරු රාශියක් අතින් ප්‍රතිසංස්කරණ කටයුතු කෙරී ඇත. බෞද්ධ ලෝකයෙහි දනට ඇති විශාලතම චෛත්‍ය වන මෙහි උස අඩි 400 ක් බව පැවසේ.

පයිධාතුව තැන්පත් කරනලද බව සඳහන්ව ඇත. පැරකුම්බා සිරිතෙහි පුවතකට අනුව දෙව් ලොව පයිධාතුව පහතට දමූ විට රජු විසින් අසූ රියනක් උස උඩපැන ඉන් අඩක් කපාගත් බව පැවසේ. බුදුරජාණන් වහන්සේ සුළු වේලාවක් මේ ස්ථානයෙහි සමාධි සුවයෙන් වැඩ සිටි බවද සඳහන් වේ.

### මතභේද:-

මුලදී කුඩාවට තිබුණු මේ චෛත්‍යය පසුව ඇතිවුණ ප්‍රතිසංස්කරණ වලදී විශාල වූ බව පැවසේ. සොලී ආක්‍රමනයෙන් පසු මහ පැරකුම්බා රජු විසින් අද ඇති තත්වයට විශාල කරනලද බව පැවසේ. උස රියන් 140 ක් බව රාජරත්නාකරයේ සඳහන් වන අතර ආසියාතික සංගමයේ සඟරාවක කැප්ටන් චැක්මන් සඳහන් කර ඇත්තේ උස අඩි 270 ක් බවයි. ගරාවැටී ඇති නිසා විශාලව පෙනුනත් මැන බලන විට අභයගිරියට වඩා අඩි 12 ක් වටය කුඩා බව 'ආර්කිටෙක්චරල් රිමේන්ස්, අනුරාධපුර' යන සඟරාවේ සඳහන් කර ඇත. හතරැස් කොටුවට යන තුරුම අභයගිරිය හා ජේතවනය සමාන බවක් දක්වයි.

### ප්‍රතිසංස්කරණ හා නවාංග:-

මිත්තසේන, ධාතුසේන, මහානාග, අග්‍රබෝධි, 3 වැනි මුගලන්, පැරකුම්බා වැනි රජවරු අනුබද්ධ පිරිවෙන් ප්‍රාසාද විහාරාංග ආදී නවාංග එකතු කිරීමෙන් හා ප්‍රතිසංස්කරණ මගින් මේ චෛත්‍ය ආරක්ෂා කරගෙන ඇති අතර ස්ථානය විශාල කරවූ බව පෙනේ. රතනමා පිරිවෙන, සෙනෙවිරත් පිරිවෙන, සිරිසංඝබෝ පිරිවෙන ආදිය ජේතවනයට අනුබද්ධ පිරිවෙන් කීපයකි. 1 වැනි සේන රජතුමා මහල් කීපයකින් යුක්ත ප්‍රාසාදයක් කරවා රන් පිළිම තුනක් තැන්පත් කළ අතර 2 වන සේන රජු එහි බෝධිසත්ව පිළිම තැන්පත් කරවා ඇත.

### අවට ඇති නටබුන්:-

ජේතවනයට දකුණින් පිහිටි ගරාදි ගල් සහිත නටබුන් දික්සඳ සෙනවියා පිරිවෙන බවට අනුමාන කරති. උතුරින් පිහිටි පොකුණ රතනමා පිරිවෙන් ජල මණ්ඩපය විය හැකිය. 4 වැනි මිහිඳු රජුගේ සෙල්ලිපියක ජල මණ්ඩපයක් ගැන සඳහන් වේ. ස්තූපයට බටහිරින් පිහිටි විශාල ගල් උළුවහු සහිත නටබුන්ව ගිය විහාරය 1 වැනි සේන රජු කරවූ, මනිමේකලා නම් විහාරය විය හැකිය. ජනවහරේ එන්නේ බුද්ධදාස රජු නාගමාණික්‍යයක් ලබාගෙන එයින් බුද්ධ ප්‍රතිමාවේ නේත්‍ර තබා කරවනලද විහාරය බවයි. මහාවංශයේ සඳහන් වන්නේ බුද්ධදාස රජ තුමා එම විහාරය අභයගිරියේ කරවූ බවයි. පසු කලක ධාතුසේන රජතුමාද මේ විහාරය ප්‍රතිසංස්කරණය කර ඇත. පාඨාන්තර වරදවා ව්‍යවහාර කිරීම නිසා මේ විහාරය බුද්ධදාස රජතුමා කරවනලද විහාරය බවට සමහරු විශ්වාස කරති. දොරටුපාල රූප, නයිපෙන සහිත ගල් පුවරු, කැඩී බිඳී ගිය ශිලා ලේඛන කැබලි, මල් ආසන, කැටයම් සහිත ගල් පුවරු ආදී වටිනා කෞතුක වස්තු රාශියක්ම ජේතවන විහාරය අවට විසිරී ඇත. දනට බස්නාහිර පෙදෙසේ පුරාවිද්‍යාව මගින් කරවනු ලබන කැණීම්වලින් කලකට පෙර පසින් වැසී තිබුණු ආරාමයක නටබුන් මතුකරගෙන පැරණි ස්වරූපයෙන් ම සකස් කරගෙන යයි.

### විශේෂතා:-

විශාලත්වය සේම චෛත්‍ය නිර්මාණය අතින් බලන විට ලක්දිව වෙනත් පැරණි චෛත්‍යයක දක්නට නොලැබෙන විශේෂ ලක්ෂණ මෙහි දක්නට ඇත. හතරැස් කොටුවේ සිට කොත් කැරැල්ලේ මුදුනත ගරා වැටී ඇති තැන දක්වා ඇතුලතින් ගමන් කළ හැකි පරිදි රවුමට පඩිපෙළි සාද ඇත. හතරැස් කොටුවේ උතුරු පැත්තේ දොරටුව තබා ඇති අතර ඇතුළට හුලං එනු සඳහා තැනින් තැන කුඩා කවුලුද තබා ඇත. පුරාවිද්‍යාඥ බෙල් මහතාගේ සමයේ කරණලද ප්‍රතිසංස්කරණ වලට අනුව පිට පැත්තෙන් ධාතු ගර්භය දිගේම හතරැස් කොටුව දක්වා ගමන් කිරීමට පහසු වන පරිදි සිමෙන්ති බඳාම යොද පඩි පෙළි සාද තිබුණු බව පෙනේ. ධාතු ගර්භය මුදුනේ හතරැස් කොටුවට ඇතුලුවීම සඳහා දොරටුව තබා ඇත. හතරැස් කොටුව ඇතුලතින් ගමන්කර හතරැස් කොටුව උඩට නැගුණ විට නැවත එතැන සිට කොත් කැරැල්ලේ ගරාවැටී ඇති තැන දක්වා ගමන් කිරීමට පඩිපෙළි ඇත. කොත් කැරැල්ලේ මැද සියයකට වුවත් සිටින්නට හැකි පරිදි සිමෙන්ති දමා සකස්කර තිබේ. කොත් කැරැල්ලේ ගරා වැටී ඇති තැන විශ්කම්භය අඩි 22 ක් පමණ වන අතර පිටතත් සමඟ අඩි 26 ක් පමණ වේ. හතරැස් කොටුවේ පැත්තක දිග අඩි 84 ක් පමණ ද පළල අඩි 20 ක් පමණ ද වේ. උස අඩි 30 ක් පමණ වේ.

හතරැස් කොටුවේ මුදුනත කොත් කැරැල්ලේ සිට අඩි 13 අඟල් 6 ක දුරින් අඩි 6 ක් සහ අඟල් 6 ක පමණ පරතරය ඇති අඩි හතරක් පමණ ගැඹුර ඇති

අගලක් ඇත. එම අගල දිගේ හතරැස් කොටුව වටේටම ගමන් කළ හැකි පරිදි සකස්කර ඇති බව පෙනේ. ධාතු ගර්භයේ සිට හතරැස් කොටුවට ඇතුලු වන දෙරටු උළුවස්ස අඩි 6 ක් සහ අගල් 6 ක් පමණ වන අතර බිම්ගෙය තුළ උස අඩි 8 ක් පමණ වේ. පළල අඩි 2½ කි. වෙනත් කිසිම චෛත්‍යයක මෙබඳු නිර්මාණයක් නැත.

ධාතු ගර්භයට ඉහලින් ගමන් කිරීමට හැකිවන පරිදි චෛත්‍යය නිර්මාණය කිරීම සාමාන්‍ය සිරිත නොවේ. එසේ වුවද ත්‍රිකාය නමස්කාරය මහායානිකයන්ට නැතිවම බැරි දෙයක් වන නිසා මහායාන බලපෑම් උඩ ධර්මකාය සම්භෝගකාය නිර්මාණකාය යන ත්‍රිකායම එකම ස්ථානයකදී නමස්කාර කරන්න හැකි පරිදි ජේතවනය නිර්මානය කර ඇති බව සමහර විද්වතුන්ගේ පිළිගැනීමයි. චෛත්‍යය ගර්භය තුලට ගමන්කර ධර්ම ග්‍රන්ථ බලන්නට හැකි පරිදි සකස්කර ඇති අතර පූර්ණ නම් වෙළෙන්ද රැගෙන ආ ධර්ම ධාතුවද මෙහි තැන්පත් කර පූජා සත්කාර කරවීමෙන් එය වඩාත් තහවුරු වේ. සාමාජික හා නිකායික විවිධ මතිමතාන්තර වලට ගොදුරුව පැවති ජේතවනය නිකායික භේද වලින් තොරව බොහෝ රජවරුන් අතින් පුද සත්කාර ලද මූලස්ථානයන්ගෙන් ප්‍රධාන එකකි.

---

කිංසු ඡෙත්වා සුඛං සෙති – කිංසු ඡෙත්වා න සොචති
කිස්සස්ස එකධම්මස්ස – වධං රොචෙසි ගොතම

කොධං ඡෙත්වා සුඛං සෙති – කොධං ඡෙත්වා න සොචති
කොධස්ස විසමූලස්ස – මධුරග්ගස්ස වාසව,
වධං අරියා පසංසන්ති – තං හි ඡෙත්වා න සොචති

ගෞතමයන් වහන්ස, කුමක් දවා සුවසේ වෙසේද? කුමක් දවා සෝක නොවන්නේද? කිනම් එක් දහමක්හුගේ නැසීම රුස්නෙහිද?

සක්දෙවිඳුනි, ක්‍රෝධය දවා සුවසේ වෙසෙයි. ක්‍රෝධය දවා සෝක නොකෙරෙයි. විෂ වූ මුල ඇති මිහිරි අග ඇති ක්‍රෝධය නැසීම ආර්යයෝ ප්‍රශංසා කරත්. එය දවාම ශෝක නොකෙරේ.